මාධ්‍ය නිවේදන අංක 09

මැතිවරණ කොමිෂන් සභාව

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.04.25**

**තැපෑලෙන් ඡන්දය දීමේ පහසුකම්**

**තැපැල් ඡන්ද හිමියන්ගේ සහ සහතික කිරීමේ නිලධාරින්ගේ අවධානය සඳහා**

2020.04.25 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තැපෑලෙන් ඡන්දය දීමට සුදුසුකම් ලැබූවන්ගේ අයදුම්පත් භාරගැනීමේ කාල සීමාව 2020 මාර්තු මස 16 දින මධ්‍යම රාත්‍රී 12.00 ට අවසන් වන බව මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන් නිවේදනය කරමි.

02. තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනය කිසිදු හේතුවක් නිසා දීර්ඝ නොකරන බැවින් තැපෑලෙන් ඡන්දය දීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇති ඡන්ද හිමියන් වහාම තම අයදුම්පත නියමිත පරිදි සම්පූර්ණ කර අදාළ සහතික කිරීමේ නිලධාරි වෙත භාර දිය යුතු බවත් එම අයදුම්පත් ලැබුණු වහාම ඒවා සහතික කොට අදාළ මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධාරි වෙත **2020 මාර්තු මස 16 දින හෝ එදිනට පෙර** යැවීමට සියලුම සහතික කිරීමේ නිලධාරින් කටයුතු කළ යුතු බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

03. කිසිදු හේතුවක් නිසා 2020 මාර්තු මස 16 දිනෙන් පසුව අදාළ තේරීම්භාර නිලධාරින් වෙත අතින් හෝ තැපැල් මඟින් ලැබෙන තැපැල් ඡන්ද අයදුම්පත් පිළිගැනීමට හැකියාවක් නොමැති බවත් එම අයදුම්පත් ප්‍රමාද අයදුම්පත් වශයෙන් සලකා ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවත් වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය .
2020.03.10